GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2012-09-20

# මාධ්‍ය නිවේදනයයි.

## ශ්‍රී ලංකාව තුල පුළුල් සෞඛ්‍ය සේවාවක අවශ්‍යතාවය

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය රාජ්‍යය සහ පෞද්ගලික යන ප්‍රධාන අංශ 02 කින් යුක්ත වේ. රාජ්‍ය අංශයේ සෞඛ්‍යය සේවයේ ගුණාත්මකභාවය ආරක්ෂාකර ගැනීමටත් නිසි රෙගුලාසි යටතේ පවත්වාගෙන යාමටත් විවිධ බලයලත් ආයතන ස්ථාපිත කර ඇති අතර ඒවා මඟින් නිරතුරුව රාජ්‍ය අංශයේ සෞඛ්‍ය කටයුතු නියාමනය කරයි. පෞද්ගලික අංශය මඟින් සපයන රෝගී සේවා නිසි කලමණාකාරිත්වයක් හා පාලනයක් ඇති කිරීම සඳහා මෙතෙක් කිසිදු සාධනීය පියවරක් ගෙන නැත. මේ නිසා රෝගීන්ට මෙන්ම එම සේවා සපයන ආයතන වලට විවිධ ගැටළුකාරී තත්වයන් වලට මුහුණපාන්නට සිදුවිය.

පෞද්ගලික රෝහල් තමන් මුහුණපාන ප්‍රධාන ගැටළුවක් ලෙස නිරන්තරයෙන් රජයට හා අනෙකුත් වගකිය යුතු අංශ වලට ඉදිරිපත් කල කාරණයක් වූයේ ඔවුන්ට අවශ්‍ය වෛද්‍යවරුන්ගේ ඇති හිඟයයි. විශේෂයෙන්ම පැය 24ම ආවරණය වන රෝගී සත්කාර සේවයක් ලබා දීමට අවශ්‍ය කරන වෛද්‍ය කාර්‍ය මණ්ඩලයක් අවශ්‍ය බව ඔවුන් අවධාරණය කරන ලද මූලික කරුණකි. ඉහත හේතුව නිසාම සමහර පෞද්ගලික ආයතන විදේශීය වෛද්‍යවරුන් බඳවා ගැනීමට පෙළඹුණි. එසේ බඳවා ගත් වෛද්‍යවරුන් වැඩි පිරිසක් නියමිත සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වූ අතර එය රෝගීන්ගේ ජීවිත වලට මෙන්ම රටේ වෛද්‍ය සේවාවේ ගුණාත්මක භාවයට දැඩි බලපෑමක් එල්ල කරන කාරණයක් විය.

ශ්‍රී ලාංකිය විශේෂඥ වෛද්‍යවරයෙකු තම MBBS උපාධියෙන් පසුව තෝරා ගත් ක්ෂේත්‍ර තුල පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා ඇතුලත් වේ. මෙහිදී වර්ෂ කිහිපයක් ඔවුන් ඉතාමත් ඉහල තලයේ පුහුණුවකට භාජනය කරන අතර අවසානයේ විදේශීය රටක එම අංශය තුල විදේශීය විශේෂඥයන් යටතේ අවම වශයෙන් වර්ෂයක පුහුණුවක් ලබා ඉහත සුදුසුකම් මත ශ්‍රී ලංකාව තුල විශේෂඥයෙකු ලෙස වැඩ කිරීමේ සුදුසුකම් ලබයි. එනමුත් පෞද්ගලික රෝහල් වලට බැදුන සමහර වෛද්‍යවරුන්ට එවැනි පුහුණුවක් හා පිලිගත් ආයතනවල ලියාපදිංචියක් නොමැති බව අනාවරණය වී ඇත.

ඉහත කරුණු කාරණා පුළුල්ව අධ්‍යයනය කල රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මෙම අර්බුදකාරී තත්වයට පිලියමක් ලෙස ඉතා සාධනීය වැඩ පිලිවෙලක් රජයට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි.

1. Sabotical leave ක්‍රමය හඳුන්වා දීම. රාජ්‍ය සේවයේ සේවය කරන වෛද්‍යවරුන්හට යම් කිසි නියමිත සේවා කාල සීමාවකට පසු පෞද්ගලික රෝහලක සේවය කිරීම වර්ෂ 1-2 කාලයක සඳහා මෙම නිවාඩු ලබා දීම. එම වෛද්‍යවරුන් ඉහත කාල සීමාව තුල පෞද්ගලික රෝහල් සේවයට අනුයුක්ත වන අතර නියමිත කාලය අවසන් වූ පසු නැවත රජයේ රෝහලට රාජකාරී කටයුතු සඳහා වාර්ථා කල යුතුය එමඟින් පෞද්ගලික රෝහල් වල වෛද්‍ය හිඟය මෙරට වෛද්‍යවරුන්ගෙන් විසඳාගත හැකි අතර ගුණාත්මකභාවය හොඳින් ආරක්ෂා වනු ඇත.

2. ඉහත ක්‍රියා පටිපාටිය පිලියෙල කරන තුරු දැනට පවතින තත්වයට පිලියමක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියෝජනය වන කමිටුවක් පත් කර එමඟින් ඉහත පටිපාටියට අනුකුල කෙටි කාලීන වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.

3. සෞඛ්‍ය සේවයේ මානව සම්පත් අවශ්‍යතාවය පිලිබඳ ජාතික මට්ටමේ අධ්‍යනක් කර එම අංශයේ දියුණුව සඳහා අවශ්‍ය පියවර නොපමාව අනුගමනය කිරීම.

4. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය ආර්ථිකමය වශයෙන් හැඩ ගැස්වීම. එනම්, Health Economy සංකල්පය හඳුන්වා දීම.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වැඩි විස්තර -


වෛද්‍ය නලින් ආරියරත්න : 0714800942
වෛද්‍ය නවීන් සොයිසා : 0718582444